# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය, තෙවන වසර - 2022

## අන්තර්ජාතික ආයෝජන නීතිය

(පැ තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 06

**එක් කොටසකින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් වත් තෝරාගෙන ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.**

(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

### අ කොටස

සෝනිකා යනු සංචාරක ව්‍යාපාරය සඳහා ප්‍රසිද්ධ සංවර්ධනය වෙමින් පවතින රටකි. දිවයිනේ දියුණු වෙමින් පවතින සංචාරක ක්ෂේත්‍රයේ ආයෝජනය කිරීමට විදේශිකයන්ට ආරාධනා කරමින්, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමට පවතින ආර්ථික අර්බුදය එහි රජය දිරිමත් කළේය. බිගෝනියාහි සංස්ථාපිත ග්ලැමර් සමූහ ව්‍යාපාරයේ [Glamour Group of Companies (GGC)] සභාපති සහ බිගෝනියානු ජාතිකයෙකු වන අයිවන්, සෝනිකා හි සුප්‍රසිද්ධ පූජනීය ස්ථානයක් අසල හෝටලයක් ඉදිකිරීම සඳහා මෙම ප්‍රවර්ධන ව්‍යාපාරය හේතුවෙන් උන්නදුවට පත් විය. සෝනිකාහි ආයෝජන ප්‍රවර්ධන ඒජන්සිය මෙම යෝජනාව ඉහළින්ම පිළිගත්තේය.

සෝනිකාහි ඔහුගේ විනෝදාස්වාද ව්‍යාපාරය (leisure business) ස්ථාපිත කිරීම සඳහා, අයිවන් සෝනිකාහි සමාගම් නීතිය යටතේ ග්ලැමර් සංවර්ධන පුද්ගලික සමාගම [Glamour Development Private Limited (Glamour Sonika)] නමින් දේශීය සමාගමක් සංස්ථාගත කළේය. යෝජිත හෝටලය ඉදිකිරීම සඳහා ඔහු ඇමෙරිකානු ඩොලර් මිලියන පහකට මිලදී ගත් ඉඩම මෙම සමාගම සතු විය. Glamour Sonika සතුව ඇත්තේ එක් කොටසක් පමණක්

වන අතර එය වෙලොනියාහි (Valonia) සංස්ථාපිත GGC හි තවත් අනුබද්ධ සමාගමක් වන ග්ලැමර් වෙලොනියා (Glamour Valonia) සතු වෙයි. Glamour Valonia හි කොටස් වලින් සියයට 99 ක් අයිවන් සතුය. අයිවන් මෙම ව්‍යාපෘතිය ගැන පෞද්ගලිකව උනන්දු වන අතර කොටස් ප්‍රතිශතය මත තීරණ ගැනීමේ අධිකාරිය ද ඔහු සතු වෙයි.

දේපල සංවර්ධනය පිළිබඳ අයිවන් සතු අඩු අත්දැකීම් හේතුවෙන්, යෝජිත හෝටලය සංවර්ධනය කිරීම සඳහා වාස්තු විද්‍යාත්මක සහ සැලසුම් උපදේශන සේවා සැපයීම සඳහා ඔහු ජාත්‍යන්තරව පිළිගත් සමාගම් කිහිපයක් යොදවා ගත්තේය. ව්‍යාපෘතියේ අනාගත අපේක්ෂාවන් හේතුවෙන් ඔවුන්ගේ සාකච්ඡා ඉතා ඵලදායී විය. අයිවන් මෙම කටයුතු සඳහා ඇමරිකානු ඩොලර් මිලියන දෙකකට වඩා වියදම් කළ අතර හෝටලය ඉදිකිරීම සඳහා සෝනිකාහි අදාළ බලධාරීන්ගෙන් අවසරයද ලබා ගත්තේය. ඔහු සැලසුම් කරමින් සිටි හෝටල් ව්‍යාපෘතියේ කළමනාකරණ තනතුරු සඳහා ප්‍රදේශවාසීන් සියයක් ද පුහුණු කළේය.

මේ අතර, සෝනිකාහි ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව [Land Reclamation and Development Corporation (LRDC)], සමාගමට දැනුම් දීමකින් හෝ එහි බලපෑම ගැන සාකච්ඡා නොකර සමාගමේ ඉඩම අසල වැවක කැණීම් කටයුතු ආරම්භ කළේය. නගරයේ නිරන්තර ගංවතුර අවම කිරීම සඳහා වන ගංවතුර පාලන වැඩසටහනේ කොටසක් ලෙස LRDC විසින් සිදු කරනු ලබන කැණීම් කටයුතු හේතුවෙන් ඉඩමේ අක්කර පහක භූමි ප්‍රමාණයක් ජලයෙන් යට විය. කෙසේ වෙතත්, නව තත්ත්වයන්ට අනුව හෝටලය ප්‍රතිව්‍යුහගත කළ හැකි යැයි සිතූ අයිවන් මෙම ව්‍යාපෘතිය පිළිබඳව සුබවාදීවිය. සිදුවෙමින් පවත්නා කැණීම් කටයුතු හේතුවෙන් Glamour Sonika මුහුණ දුන් දුෂ්කරතා පිළිබඳව සාකච්ඡා කිරීමට ඔහු සෝනිකාහි ඉහළ පෙළේ නිලධාරීන් සමඟ රැස්වීම් කිහිපයක් පැවැත්විය.

අවසානයේදී, Glamour Sonika හට අයත්ව තිබූ ඉඩම පවරා ගැනීමට සිය ඉඩම් අත්පත් කර ගැනීමේ මණ්ඩලයට (Land Acquisition Board (LAB)] අවසර දෙමින් සෝනිකා ගැසට් නිවේදනයක් නිකුත් කළේය. අත්පත් කර ගැනීමෙන් පසුව, Glamour Sonika හට වන්දි වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන දෙකක මුදලක් පිරිනමන ලදී. කෙසේ වෙතත්, අත්පත් කරගත් ඉඩමේ වෙළඳපල වටිනාකමට වඩා අඩුවෙන් වන්දි ලබා දීම සම්බන්ධව අයිවන්

සැහීමකට පත් නොවීය. එසේම, යෝජිත ගංවතුර පාලන වැඩසටහන සඳහා එහි වැදගත්කම පෙනෙන්නට තිබියදීත්, සෝනිකාහි ප්‍රමුඛ පෙළේ දේශපාලනඥයෙකුට අයත් යාබද ඉඩම අත්පත් කර ගෙන නොමැති බව ඔහු අනාවරණය කර ගත්තේය.

වන්දි මුදල සමාලෝචනය කිරීමට LAB වෙත අභියාචනයක් ගොනු කරන ලෙස අයිවන් ග්ලැමර් සෝනිකා හට උපදෙස් දුන්නේය. අභියාචනය විභාග වෙමින් පවතින අතරතුර, ආයෝජන ආරවුල් බේරුම්කරණය සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානයේදී [International Centre for Settlement of Investment Disputes (ICSID)] සෝනිකාට එරෙහිව ජාත්‍යන්තර බේරුම්කරණයක් ආරම්භ කිරීමට අයිවන් තීරණය කළේය. සෝනිකා, බිගෝනියා සහ වෙලොනියා වැනි රටවල් සමඟ ද්විපාර්ශ්වික ආයෝජන සම්මුතීන් [Bilateral Investment Treaties (BITs)] පනහකට වඩා අත්සන් කර ඇත. දේශීය ප්‍රතිකර්ම අවසාන කිරීමෙන් තොරව සෘජුවම ICSID වෙත යාමට ආයෝජකයින්ට ඉඩ සලසා දෙමින්, මෙම සම්මුති දෙකම නිසි පරිදි අපරානුමත කර ඇත. ඒවායේ සියලුම මූලික සැලකීමේ සම්මතයන් (treatment standards) මෙන්ම ආයෝජන පිළිබඳ සම්ප්‍රදායික වත්කම් මත පදනම් වූ නිර්වචනයද (asset-based BIT definition of investment) ඇතුළත් වේ.

1. සෝනිකා හි ඔහුගේ ව්‍යාපාරය අන්තර්ජාතික ආයෝජන නීතිය යටතේ ආරක්ෂා වේද සහ, එසේ නම්, සෝනිකාට එරෙහිව ආයෝජන බේරුම්කරණයකදී වඩාත්ම සුදුසු හිමිකම් කියන්නා කවුරුන්ද හෝ කුමන ආයතනයද යන්න පිළිබඳව අයිවන් සැක පහළ කරයි. GGC හි නීති උපදේශකයා ඔබ යැයි උපකල්පනය කරන්න. අයිවන්ගේ සලකා බැලීම් (concerns) ආමන්ත්‍රණය කරන නීතිමය මතයක් සකස් කරන්න. වලංගු අධිකාරීන් ඇසුරින් ඔබේ ස්ථාවරය සනාථ කරන්න.

2. බේරුම්කරණ ක්‍රියාවලියකදී සෝනිකා වෙත එල්ල විය හැකි බරපතලම චෝදනා මොනවාද? ~~අදාල~~ අදාළ බේරුම්කරණ ප්‍රදානයන් ඔබේ පිළිතුර සනාථ කළ යුතුය.

3. මහජන අවශ්‍යතා සඳහා නියාමනය කිරීමේ අයිතිය අන්තර්ජාතික නීතිය යටතේ ඇති ප්‍රධාන ස්වෛරී වරප්‍රසාදවලින් එකක් වුවද, අන්තර්ජාතික ආයෝජන සම්මුතීන්

තවමත් නියාමන පවරා ගැනීම් (regulatory takings) සඳහා වන්දි ගෙවන ලෙස වගඋත්තරකාර රාජ්‍යයන්ගෙන් ඉල්ලා සිටී. මෙම විරුද්ධාභාසය (paradox) ඇසුරින්, මෙම අවස්ථාවේ දී, රටට එරෙහි යම් ආයෝජන බේරුම්කරණයකදී සෝතිකා හට ආරක්ෂා (defend) විය හැකි ආකාරය සාකච්ඡා කරන්න. නඩු තීන්දු අධිකාරිය ඇසුරින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

## ආ කොටස

4. "ආර්ථික හා සමාජ සංවර්ධනයේදී ඔවුන් ඉටු කළ යුතු කාර්යභාරය තීරණය කරමින් සහ විශේෂිත අංශවල විදේශීය ආයෝජකයන්ගේ පැවැත්ම (presence) තහනම් කිරීමට හෝ සීමා කිරීමට ඔවුන්ට ඉඩ සලසමින්, බහුජාතික සමාගම්වලට ප්‍රවේශය (entry) සහ ස්ථාපනය කිරීම (establishment) පාලනය කිරීමට සහ නියාමනය කිරීමට සත්කාරක රාජ්‍යයන්ට අයිතියක් ඇති බව අන්තර්ජාතික නීතිය පිළිගනී. කෙසේ වෙතත්, මෙම උත්තරීතර අධිකාරිය සීමිත වන අතර එය ප්‍රවේශ වීමෙන් (entry) පසුව 'යම් නිශ්චිත ප්‍රමිතියක පිළිගත හැකි සැලකීමකට' (certain standard of decent treatment) යටත් වේ."

අන්තර්ජාතික ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා එවැනි සත්කාරක රාජ්‍යයන් විසින් සපයනු ලබන ඇතුලත්වීමේ කොන්දේසි (entry commitments) වලට එරෙහිව අන්තර්ජාතික ආයෝජන නියාමනය කිරීමට සත්කාරක රාජ්‍යයන් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. අදාල අධිකාරීන් ඇසුරින් ඔබේ පිළිතුර සනාථ කළ යුතුය.

5. "සංවර්ධනය වෙමින් පවතින රටවල සෘජු විදේශ ආයෝජනවල අහිතකර බලපෑම් අවම කිරීමට ප්‍රාග්ධන-අපනයන රාජ්‍යයන්ට උපකාර කල හැකිය. කෙසේ වෙතත්, ප්‍රාග්ධන අපනයනය කරන රාජ්‍යයන් ආයෝජන ආරක්ෂාවට වඩා වැඩි දෙයකට සම්බන්ධ වීමට මැලිකමක් දක්වයි".

අන්තර්ජාතික නීතිය යටතේ ඉහත ප්‍රකාශයේ වලංගු භාවය සහ මව් රාජයන්ගේ යුතුකම් සහ වගකීම් 'හානියක්-නොවීමේ' මූලධර්මය සම්බන්ධ අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීමේදී මව් රාජ්‍ය නීතිවල දේශසීමාවෙන් පිටත ස්වභාවයේ (extraterritorial nature) කාර්යක්ෂමතාව විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. අදාල අධිකාරීන් ඇසුරින් ඔබේ පිළිතුර සනාථ කළ යුතුය.

6. සෝම්බ්‍රා යනු ඍජු විදේශ ආයෝජනවලට අනුග්‍රහය දක්වන අතරම තම ආර්ථිකය දියුණු කිරීමට උත්සාහ කරන සංවර්ධනය වෙමින් පවතින රටකි. සොම්බ්‍රා රජය එහි ආයෝජන නීති සහ ප්‍රතිපත්ති සංශෝධනය කිරීම සඳහා විදේශ ආයෝජන පිළිබඳ විශේෂඥ කමිටුවක් පිහිටුවන ලදී. ක්‍රියාකාරීන් (actors) අතර හවුල් වගකීම් (shared responsibilities) සහතික කරන්නේ නම් මිස විදේශීය ආයෝජන ආර්ථික වර්ධනයට සැමවිටම හිතකර නොවන බව මූලික අධ්‍යයනයට අනුව කමිටුව සොයා ගත්තේය. දැන්, කමිටුව ඔබව පර්යේෂණ සහායකයෙකු ලෙස යොදවා ගැනීමට අදහස් කරන අතර 'සංවර්ධනය වෙමින් පවතින රටවල විදේශ ආයෝජනවල ප්‍රතිලාභ උපරිම කිරීමෙහිලා ක්‍රියාකාරීන්ගේ භූමිකාව' යන මාතෘකාව යටතේ ඔබෙන් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටී.

විදේශ ආයෝජන පිළිබඳ පරස්පර විරෝධී ආර්ථික න්‍යායන් (conflicting economic theories) සැලකිල්ලට ගනිමින් ඉහත වාර්තාව කෙටුම්පත් කරන්න. අදාල අධිකාරීන් ඇසුරින් ඔබේ පිළිතුර සනාථ කළ යුතුය.

*****